# කාර්යසාධන වාර්තාව 2017

# නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

**2017.01.01 – 2017.12.31**


නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

අංක 80, 4 වන මහල, අධිකරණ මාවත, කොළඹ 12

www.lawcom.gov.lk

## 1. හැඳින්වීම

1969 අංක 3 දරන නීති කොමිෂන් සභා පනත යටතේ ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාව පිහිටුවන ලද අතර, නීති ප්‍රතිසංස්කරණ නිර්දේශ කරනු ලබන රජයේ ප්‍රධානම ආයතනය ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාව වේ. පරිපාලනය සඳහාත්, පර්යේෂණ සඳහා සහයෝගය ලබාදීම සඳහාත්, නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලදී.

## 2. දැක්ම

යහපාලනය උදෙසා නීතියේ ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම.

## 3. මෙහෙවර

නීති ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම සඳහා 1969 අංක 3 දරන නීති කොමිෂන් සභා පනතේ දක්වා ඇති කාර්යයන් ක්‍රියාවේ යෙදවීම.

## 4. අරමුණු සහ කාර්යයන්

නීති කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ වනුයේ, නීති ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම වේ. එවැනි ප්‍රවර්ධන අරමුණු කරගනිමින් නීති කොමිෂන් සභාව මගින් පහත දක්වා ඇති කාර්යයන් ක්‍රියාවට නංවනු ලබයි.

I. නීතිය සංග්‍රහ ගත කිරීම.

II. නීතියේ විෂමතා නැති කිරීම.

III. හරයාත්මක නීතිය මෙන්ම කාර්ය පටිපාටික නීතිය ද ක්‍රමානුකූලව සංවර්ධනය කිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ අදහසින් සමාලෝචනය කිරීම සහ පවත්වාගෙන යාම.

IV. කාලෝචිත නොවන සහ අනවශ්‍ය පනත් ඉවත් කිරීම.

V. නීතිය සරල කිරීම සහ නවීකරණය කිරීම.

VI. නීති ප්‍රතිසංස්කරණය සඳහා වන යෝජනා භාරගෙන ඒවා සලකා බැලීම.

VII. ප්‍රතිසංස්කරණය කිරීමේ අදහසින් නීතියේ විවිධ අංශ පරීක්ෂා කිරීම සඳහා වන වැඩසටහන් කලින් කලට සකස්කොට අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම.

VIII. වෙනත් රටවල නීති ක්‍රම පිළිබඳව තොරතුරු ලබා ගැනීම.

IX. අනු නීති මනාව පිළිගත් සිද්ධාන්තවලට හා නීතියේ මහිමයට අනුකූල වන බව සුරක්ෂිත කිරීමේ අදහසින්, පාර්ලිමේන්තුව නොවන වෙනත් මණ්ඩල විසින්, අනු නීති සෑදීමේ බලය ක්‍රියාත්මක කිරීම නිරන්තරයෙන් සමාලෝචනය කිරීම.

X. නඩුකිම හා සම්බන්ධ පරිපාලනාත්මක ස්වභාවයේ කාර්ය පටිපාටිය ඇතුළුව නීති කාර්ය පටිපාටි තර්කාපණය කිරීම හා සරල කිරීම සඳහා වැඩසටහන් ක්‍රමානුකූලව සකස් කිරීම.

XI. සිංහල භාෂාවෙන්, දමිළ භාෂාවෙන් හා ඉංග්‍රීසි භාෂාවෙන් නීතිය සංග්‍රහ ගත කිරීම සඳහා වැඩසටහන් සකස් කිරීම.

**නීති කොමිෂන් සභාවේ නව සමාජිකයන් ලෙස පහත නම් දක්වා ඇති අය පත් කරන ලදී.**

1. ජනාධිපති නීතිඥ රොමේෂ් ද සිල්වා මහතා (සභාපති)
2. මහාචාර්ය ලක්ෂ්මන් මාරසිංහ මහතා
3. ජනාධිපති නීතිඥ පාලිත ප්‍රනාන්දු මහතා
4. ජේ. එම්. ස්වාමිනාදන් මහතා
5. එන්. සෙල්වකුමාරන් මහතා
6. ජනාධිපති නීතිඥ එම්. ඉක්‍රම් මොහොමඩ් මහතා
7. ජනාධිපති නීතිඥ එස්. අනිල් සිල්වා මහතා
8. ජනාධිපති නීතිඥ ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා
9. ජනාධිපති නීතිඥ මනෝහාර ද සිල්වා මහතා
10. ජනාධිපති නීතිඥ සංජීව පී. ජයවර්ධන මහතා
11. ධාරණී එස්. විජේතිලක මිය
12. මහාචාර්ය කාමිනා ගුණරත්න මිය
13. ජී. ජී. අරුල්ප්‍රගාසම් මහතා
14. තිසත් විජේගුණවර්ධන මහතා
15. නවින් සුරත් මාරපන මහතා.

**නිලබලයෙන් පත් වූ සාමාජිකයන්:**

I. දීපානි කුමාරජීව මිය, නීති කෙටුම්පත් සම්පාදක / නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව.

II. පියුමන්ති පීරිස් මිය, අතිරේක ලේකම් (නීති) / අධිකරණ අමාත්‍යාංශය.

III. ජනාධිපති නීතිඥ සංජය රාජරත්නම් මහතා, අතිරේක සොලිසිටර් ජෙනරාල්/ නීතිපති දෙපාර්තමේන්තුව.

**දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය:**

- සෙව්වන්දි අබේසේකර මිය, ලේකම් (වැ.බ.) / නීති කොමිෂන් සභාව.
- ලිලන්ති පතිනාගොඩ මිය, සහකාර ලේකම් / නීති කොමිෂන් සභාව.
- ඒ.ජී.පී.වයි.චතුරංගිකා මිය, සහකාර ලේකම් / නීති කොමිෂන් සභාව.
- එම්.වයි.සී.ද සිල්වා මිය, සහකාර ලේකම් / නීති කොමිෂන් සභාව.

## 5. නීති කොමිෂන් සභාවේ කාර්ය සාධන ප්‍රගතිය

### 2017.12.31 දින දක්වා නිර්දේශිතයන්ගේ ප්‍රගතිය

1.) වැඩිහිටි තැනැත්තන් සම්බන්ධයෙන් වන්නා වූ නීතිය සඳහා සංශෝධනය.

| | |
|---|---|
| නිර්දේශිතය | වැඩිහිටි තැනැත්තන් සම්බන්ධයෙන් වන්නා වූ නීතිය සඳහා සංශෝධනය. |
| පසුබිම | වැඩිහිටි තැනැත්තන් සඳහා දැනට පවතින නීතිමය ආරක්ෂාව ශක්තිමත් කිරීම. |
| වත්මන් තත්ත්වය | සාකච්ඡා වෙමින් පවතියි. |

2.) අත්අඩංගුවට ගැනීමේ නීතිය සඳහා සංශෝධන.

| | |
|---|---|
| නිර්දේශිතය | අත්අඩංගුවට ගැනීමේ නීතිය සඳහා සංශෝධනය. |
| පසුබිම | පොලිස් නිලධාරීන් සතු අත්අඩංගුවට ගැනීමේ ව්‍යවස්ථාපිත බලය සම්බන්ධයෙන් වන චර්යාවන් සංග්‍රහය ප්‍රතිශෝධනය කිරීම. |
| වත්මන් තත්ත්වය | සාකච්ඡා වෙමින් පවතියි. |

3.) ජිනීවා සම්මුතියෙහි රාජ්‍ය පාර්ශ්වයක් වශයෙන් බාරගනු ලැබූ ශ්‍රී ලංකාවේ බැඳීම් සැලකිල්ලට ගෙන, 2006 අංක 4 දරන ජිනීවා සම්මුති පනත සමාලෝචනය කිරීම.

| | |
|---|---|
| නිර්දේශිතය | ජිනීවා සම්මුතියෙහි රාජ්‍ය පාර්ශ්වයක් වශයෙන් බාරගනු ලැබූ ශ්‍රී ලංකාවේ බැඳීම් සැලකිල්ලට ගෙන, 2006 අංක 4 දරන ජිනීවා සම්මුති පනත සමාලෝචනය කිරීම. |
| පසුබිම | 2006 අංක 4 දරන ජිනීවා සම්මුති පනත සමාලෝචනය කිරීම. |
| වත්මන් තත්ත්වය | සාකච්ඡා වෙමින් පවතියි. |

4.) බාලවයස්කරුවන් මිය යාම මත අලාභහානි අයකර ගැනීම.

| | |
|---|---|
| නිර්දේශිතය | බාලවයස්කරුවන් මිය යාම මත අලාභහානි අයකර ගැනීම. 2017.05.08 වන දිනදී අධිකරණ අමාත්‍යාංශය විසින් නීති කොමිෂන් සභාවේ නිරීක්ෂණය සඳහා මෙම සංශෝධනය ඉදිරිපත් කරන ලදී. |
| පසුබිම | නොසැලකිල්ල හෝ හදිසි අනතුරක් හේතුවෙන් බාලවයස්කාර දරුවකුගේ මරණය සිදුවූ විටක, එහි ප්‍රතිඵලයක් වශයෙන් එකී දරුවාගේ මාපියන්ට ඇතිවන මානසික වේදනාව සහ චිත්ත පීඩාව සඳහා නඩුකරයක් පැවරීමෙන් අලාභහානි අයකර ගැනීමට එකී මාපියන්ට නොහැකි වීම රෝම ලන්දේසි නීතියේ ස්ථාවරය බවට පත්වී ඇත.<br>යථෝක්ත ස්ථාවරය වර්තමානයේ දී යුක්තියේ මූලධර්මයන්ට ප්‍රත්‍යක්ෂවම අනුකූල නොවේ. යම් තෙවන පාර්ශ්වයක නොසැලකිල්ල හෝ අපරීක්ෂාකාරීත්වය නිසා බාලවයස්කාර දරුවකුගේ මරණය සිදුවූ විටක, එහි ප්‍රතිඵලයක් වශයෙන් මාපියන්ට ඇතිවන මානසික වේදනාව සහ චිත්ත පීඩාව සඳහා අලාභහානි අයකර ගැනීමට එකී දරුවාගේ මාපියන්ට හැකියාවක් තිබිය යුතුය.<br>යම් තෙවන පාර්ශ්වයක නොසැලකිල්ල හෝ අපරීක්ෂාකාරීත්වය බාලවයස්කාර දරුවකුගේ මරණයට හේතුව වන විටක, එකී දරුවාගේ මාපියන්ට ඇතිවන මානසික වේදනාව සඳහා මෙන්ම එකී දරුවාගේ අනාගත ඉපයුම් අහිමි වීම වෙනුවෙන් ද අලාභහානි අයකර ගැනීමට එකී දරුවාගේ මාපියන්ට හැකි විය යුතු බව සහතික කිරීම පිණිස පනතක් හඳුන්වා දීම සඳහා වන්නා වූ සංශෝධනය. |
| වත්මන් තත්ත්වය | නීති කොමිෂන් සභාව විසින් නීති කෙටුම්පත් සම්පාදක වෙත පනත් කෙටුම්පත සැකසීම පිණිස ඉහත නිර්දේශය ඉදිරිපත් කරනු ලැබීය. |

5.) 2007 අංක 7 දරන සමාගම් පනත සඳහා සංශෝධන.

| | |
|---|---|
| නිර්දේශිතය | 2007 අංක 7 දරන සමාගම් පනත සඳහා සංශෝධන.<br>2017.06.22 වන දිනදී අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් නීති කොමිෂන් සභාව වෙත මෙම සංශෝධනය සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී. |
| පසුබිම | අද්මිනිස්ත්‍රාසිකරුවෝ සහ ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් දැනට ඇති විධිවිධාන මෙම කාර්යය සඳහා ප්‍රමාණවත් නොවන බවට හඳුනාගෙන ඇත. විශේෂයෙන්ම, සමාගමක් සම්බන්ධයෙන් වන විටදී, ඇවර කිරීම් වරක් පැවැත්වීමේදී ඒවායේ ස්වභාවික නිමාව වන සමාගම විසුරුවා හැරීම කරා එම ක්‍රියා පත්වන නිසා, යළි ඇති කිරීමට අවකාශයක් නොමැත.<br>අද්මිනිස්ත්‍රාසිකරුවෝ සම්බන්ධයෙන් පනතේ දැනට අඩංගු විධිවිධානයන් සමාගම විසින්ම කරනු ලබන ඉල්ලීමට සීමා වී ඇත. |
| වත්මන් තත්ත්වය | කෙටුම්පත අවසන් කර අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත යවන ලදී. |

6.) දික්කසාදය, භාරකාරත්වය සහ දික්කසාද දීමනා සම්බන්ධයෙන් වන නීතිය.

| | |
|---|---|
| නිර්දේශිතය | දික්කසාදය, භාරකාරත්වය සහ දික්කසාද දීමනා සම්බන්ධයෙන් දැනට පවතින නීතිය සඳහා සංශෝධනය. |
| පසුබිම | පිළිසකර කරගත නොහැකි විවාහ බිඳවැටීම් සම්බන්ධයෙන් වන්නාවූ දික්කසාදය, දික්කසාද දීමනා සහ භාරකාරත්වය පිළිබඳව දැනට පවතින නීති සහ ආඥා පනත්, එම කරුණු පහසුවෙන් අවබෝධ කර ගත හැකි ලෙස ක්‍රමානුකූලව සකසා, එම නීති සහ ආඥා පනත් සියල්ලම එකට එකතුකර එක් ආඥා පනතක් ලෙස සංග්‍රහගත කිරීම.<br>• පොදු එකඟතාවක් ඇති අවස්ථාවක්.<br>• එක් පාර්ශවයකට දික්කසාදය අවශ්‍ය නොවන්නාවූ බැවින් අන්‍යෝන්‍ය එකඟතාවයක් නොමැති අවස්ථාවක්.<br>භාරකාරත්වය : දරුවාගේ යහපත වෙනුවෙන්.<br>දික්කසාද දීමනා : සාධාරණ සහ යුක්ති සහගත අධිකරණ බලය.<br>නඩත්තු : අධිකරණ බලය මහේස්ත්‍රාත් අධිකරණයකට නොව දිස්ත්‍රික් අධිකරණයකට පැවරිය යුතු අතර ඊට ඌනපූරකව එකතුකළ බලය ක්‍රියාත්මක කිරීම ප්‍රමාණවත් කිරීම සහ දඩුවම් පිණිස වන බලය දිස්ත්‍රික් අධිකරණය වෙත පැවරිය යුතුය. |
| වත්මන් තත්ත්වය | මෙම කරුණ සම්බන්ධයෙන් සාකච්ඡා අවසාන කර, ව්‍යවස්ථාව කෙටුම්පත් කිරීම සඳහා එම නිර්දේශ නීති කෙටුම්පත් සම්පාදක වන දීපානි කුමාරජීව මිය වෙත බාර දෙන ලදී. |

7.) නඩු භාණ්ඩ බැහැර කිරීම සම්බන්ධයෙන් වන නීතිය.

| | |
|---|---|
| නිර්දේශිතය | නඩු භාණ්ඩ බැහැර කිරීම සම්බන්ධයෙන් වන නීතිය. |
| පසුබිම | අධිකරණයේ නඩු විභාගය සඳහා ප්‍රචීන සාක්ෂ්‍යය වශයෙන් නිරාවරණය කළ යුතු බැවින් ආයුධ, ඇඳුම් සහ නීති විරෝදී මත්පැන් බෝතල් හා මත් ද්‍රව්‍ය වැනි වැදගත් නඩු භාණ්ඩයන් අධිකරණ භාණ්ඩ භාරකරුගේ භාරයේ තබනු ලබයි. නඩු විභාගය අවසානයේදී නිකුත් කරනු ලබන උසාවි නියෝගයක් මත පමණක් ඒවා බැහැර කළ හැකි වේ. |
| වත්මන් තත්ත්වය | සාකච්ඡා වෙමින් පවතින අතර පූර්ව නීතිපති ලෙස කටයුතු කළ ජනාධිපති නීතිඥ පාලිත ප්‍රනාන්දු මහතා විසින් මේ සම්බන්ධයෙන් කෙටුම්පතක් ඉදිරිපත් කරන ලදී. |

8.) අධිකරණයට අපහාස කිරීම පිළිබඳ වන්නා වූ නීතිය.

| නිර්දේශිතය | අධිකරණයට අපහාස කිරීම පිළිබඳ වන්නා වූ නීතිය. |
|---|---|
| පසුබිම | යෝජනා කරන ලද පනතේ ප්‍රධානම කාර්යය වන්නේ, අපහාස කිරීම පිළිබඳ වන්නා වූ නීතිය සංග්‍රහ ගත කිරීම සහ එහි විෂය පථය පැහැදිළි කිරීම වේ. |
| වත්මන් තත්ත්වය | සාකච්ඡා වෙමින් පවතියි. තිසත් විජයගුණවර්ධන මහතා විසින් සකස් කරන ලද අධිකරණයට අපහාස කිරීම පිළිබඳ වන්නා වූ කෙටුම්පත සභාගත කරන ලද අතර එකී නීතියේ පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් වන නිරීක්ෂණ ලබා දෙන ලෙස සභාපති විසින් ආචාර්ය ජේ.එම්.ස්වාමිනාදන් මහතා වෙත ඉල්ලීමක් කරන ලදී.<br>අ.) අපහාස කිරීම යනුවෙන් අදහස් කරනුයේ කුමක්ද?<br>ආ.) එය දඬුවම් ලැබිය හැකි වන්නේ කවරවිටද?<br>ඇ.) අධිකරණයේ පටිපාටිය.<br>ඈ.)අතුරු උසාවි නියෝගයකට අකීකරු වූ විටකදී ඇතිවන තත්ත්වය.<br>ඉ.) අවසාන උසාවි නියෝගයකට අකීකරු වූ විටකදී ඇතිවන තත්ත්වය. |

## 6. 2017.01.01 සිට 2017.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2017 වර්ෂය සඳහා මුළු ශුද්ධ ප්‍රතිපාදන (රු.) | 2017/12/31 දිනට වියදම (රු.) | 2017/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 15,335,000.00 | 14,782,622.56 | 96% |
| ප්‍රාග්ධන වියදම් | 1,950,000.00 | 1,727,612.47 | 89% |
| එකතුව | **17,285,000.00** | **16,510,235.03** | **96%** |

## 7. මූල්‍ය කාර්යසාධනය (පුනරාවර්තන වියදම්) 2017/01/01 – 2017/12/31 දක්වා

| | වැය විස්තර | 2017 අයවැය ඇස්තමේන්තුව රු. | මූ.රෙ 66 යටතේ මාරු කිරීම් | 2017 මුළු ශුද්ධ වෙන් කිරීම් | 2017/01/01 සිට 2017/12/31 දක්වා මුළු වියදම් රු. |
|---|---|---|---|---|---|
| | පුද්ගල පඩිනඩි | | | | |
| 1001 | වැටුප් හා වේතන | 5,000,000.00 | - | 5,000,000.00 | 4,955,154.58 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 200,000.00 | - | 200,000.00 | 160,055.95 |
| 1003 | වෙනත් දීමනා | 5,000,000.00 | (400,000.00) | 4,600,000.00 | 4,296,439.13 |
| | ගමන් වියදම් | | | | |
| 1101 | දේශීය | 50,000.00 | (37,000.00) | 13,000.00 | 12,765.00 |
| 1102 | විදේශීය | 1,025,000.00 | 360,000.00 | 1,385,000.00 | 1,366,490.07 |
| | සැපයීම් | | | | |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | 350,000.00 | 19,000.00 | 369,000.00 | 365,715.25 |
| 1202 | ඉන්ධන | 350,000.00 | 42,000.00 | 392,000.00 | 369,994.12 |
| 1203 | ආහාර පාන හා නිල ඇඳුම් | 200,000.00 | (60,000.00) | 140,000.00 | 139,586.50 |
| | නඩත්තු වියදම් | | | | |
| 1301 | වාහන | 550,000.00 | (52,000.00) | 498,000.00 | 497,702.00 |
| 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 350,000.00 | (222,000.00) | 128,000.00 | 121,160.71 |
| 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 100,000.00 | 80,000.00 | 180,000.00 | 179,200.50 |
| | සේවා | | | | |
| 1402 | තැපැල් සහ සන්නිවේදනය | 500,000.00 | (110,000.00) | 390,000.00 | 368,766.74 |
| 1403 | විදුලිය සහ ජලය | 1,100,000.00 | 400,000.00 | 1,500,000.00 | 1,424,959.85 |
| 1409 | වෙනත් | 400,000.00 | 10,000.00 | 410,000.00 | 398,344.07 |
| | මාරු කිරීම් | | | | |
| 1502 | විශ්‍රාමික ප්‍රතිලාභ | 30,000.00 | (30,000.00) | - | - |
| 1506 | රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොළී | 130,000.00 | - | 130,000.00 | 126,288.09 |
| | එකතුව | **15,335,000.00** | - | **15,335,000.00** | **14,782,622.56** |

## 8. මූල්‍ය කාර්යසාධනය (ප්‍රාග්ධන වියදම්) 2017/01/01 – 2017/12/31 දක්වා

| වැය විෂය | වැය විස්තරය | 2017 සඳහා මුළු අයවැය ඇස්තමේන්තුව රු. | මු.රෙ 66 යටතේ මාරු කිරීම් | 2017 මුළු ශුද්ධ වෙන් කිරීම් | 2017/01/01 සිට 2017/12/31 දක්වා මුළු වියදම් රු. |
|---|---|---|---|---|---|
| | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | | | | |
| 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 100,000.00 | - | 100,000.00 | - |
| 2003 | වාහන | 250,000.00 | - | 250,000.00 | 156,029.58 |
| | ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම | | | | |
| 2102 | ලී බඩු සහ කාර්යාල උපකරණ | 350,000.00 | - | 350,000.00 | 346,982.26 |
| | ශක්‍යතා වර්ධනය | | | | |
| 2401 | පුහුණු සහ ශක්‍යතා වර්ධනය | 1,250,000.00 | - | 1,250,000.00 | 1,224,600.63 |
| | එකතුව | **1,950,000.00** | - | **1,950,000.00** | **1,727,612.47** |

## 9. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම - 2017 දෙසැම්බර් 31 දිනට

| | වියදමෙහි උපරිම සීමාව | ලැබීම්වල අවම සීමාව | හර ශේෂයන්ගේ උපරිම සීමාව |
|---|---|---|---|
| විසර්ජන පනතින් බලය දෙනු ලැබූ සීමාවන් : | 1,200,000.00 | 500,000.00 | 2,500,000.00 |
| වර්ෂය තුළ ප්‍රතිශෝධන සීමාවන් :* | - | - | - |
| වර්ෂය අවසානයේ සත්‍ය අගයන් : | 1,151,514.00 | 876,050.32 | 2,478,258.62 |

### අත්තිකාරම් ගිණුම් සඳහා වූ පාලන ගිණුම්වල සාරාංශය - 2017

| | දෙපාර්තමේන්තු පොත් අනුව | භාණ්ඩාගාර පරිගණක වාර්තා අනුව |
|---|---|---|
| වර්ෂය ආරම්භයේ ඉදිරියට ගෙන ආ ශේෂය (2017.01.01 දිනට) | 2,202,794.94 | 2,202,794.94 |
| <u>එකතු කළා</u> : වර්ෂය තුළ මුළු හර කිරීම් | 1,151,514.00 | 1,209,379.00 |
| <u>අඩුකළා</u> : වර්ෂය තුළ මුළු බැර කිරීම් | 876,050.32 | 933,915.32 |
| වර්ෂය අවසානයේ ශේෂය (2017.12.31 දිනට) | **2,478,258.62** | **2,478,258.62** |

## 10. 2017.12.31 වන දිනට කාර්ය මණ්ඩල සංයුතිය

| තනතුර | ශ්‍රේණිය | වැටුප් තලය | සේවා මට්ටම | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| ලේකම් | I | SL1/2016 | 1 | 1 | - | 1 |
| නියෝජ්‍ය ලේකම් | II | SL 1/2016 | 1 | 1 | - | 1 |
| සහකාර ලේකම් | III | SL 1/2016 | 1 | 4 | 4 | - |
| භාෂා පරිවර්තක | I | MN 6/2016 | 2 | 1 | 1 | - |
| ගිණුම් සහකාර නිලධාරී | III | MN 4/2016 | 3 | 1 | - | 1 |
| සංවර්ධන නිලධාරී | III | MN 4/2016 | 3 | 4 | 2 | 2 |
| පුස්තකාලයාධිපති | III | MN 3/2016 | 3 | 1 | 1 | - |
| කළමනාකරණ සහකාර | III | MN 2/2016 | 3 | 8 | 3 | 5 |
| ලඝුලේඛිකා | III | MN 1/2016 | 3 | 1 | - | 1 |
| රියදුරු | III,II,I | PL 3/2016 | 4 | 4 | 4 | - |
| කා.කා.ස. | III,II,I | PL 1/2016 | 4 | 3 | 3 | - |
| එකතුව | | | | **29** | **18** | **11** |